(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 162.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2017 අප්‍රේල් මස 28 වැනි සිකුරාදා පූ. භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **තිලංග සුමතිපාල මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභාපතිතුමා

---

ගරු **තලතා අතුකෝරල මහත්මිය,** විදේශ රැකියා අමාත්‍යතුමිය

ගරු **වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් අමුණුගම මහතා,** විශේෂ කාර්යභාර අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **පලනි දිගම්බරම් මහතා,** කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා

ගරු **නවීන් දිසානායක මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා

ගරු **හරින් ප්‍රනාන්දු මහතා,** විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **ෆයිසර් මුස්තාපා මහතා,** පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **අනුර ප්‍රියදර්ශන යාපා මහතා,** ආපදා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **අර්ජුන රණතුංග මහතා,** වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා

ගරු **පාඨලී චම්පික රණවක මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **මහින්ද සමරසිංහ මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා

ගරු **විජිත් විජයමුණි සොයිසා මහතා,** වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **ඩී. එම්. ස්වාමිනාදන් මහතා,** බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **කබීර් හෂීම් මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩිලාන් පෙරේරා මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා,** පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුනේෂ් ගන්කන්ද මහතා,** ආපදා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා,** අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා සහ බුද්ධශාසන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මනූෂ නානායක්කාර මහතා,** විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික බණ්ඩාරනායක මහතා,** නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රන්ජන් රාමනායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩුලිප් විජේසේකර මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. එම්. එම්. හරීස් මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා**

ගරු **ආනන්ද අලුත්ගමගේ මහතා**

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා**

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා**

ගරු **චන්ද්‍රසිරි ගජදීර මහතා**

ගරු **උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා**

ගරු **බන්දුල ගුණවර්ධන මහතා**

ගරු **එඩ්වඩ් ගුණසේකර මහතා**

ගරු **ඩී. වී. චානක මහතා**

ගරු **සිසිර ජයකොඩි මහතා**

ගරු **නලින් බණ්ඩාර ජයමහ මහතා**

ගරු **පියංකර ජයරත්න මහතා**

ගරු **(වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**

ගරු **ලකී ජයවර්ධන මහතා**

ගරු **ආරුමුගන් තොණ්ඩමන් මහතා**

ගරු **සිරිනාල් ද මෙල් මහතා**

ගරු **අනුර දිසානායක මහතා**

ගරු **වීරකුමාර දිසානායක මහතා**

ගරු **සාලින්ද දිසානායක මහතා**

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මොහොමඩ් නවවි මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා

ගරු ඉම්රාන් මහරුෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු තිලක් මාරපන මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු බිමල් රත්නායක මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු ඒ. ඒ. විජේතුංග මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු හේෂාන් විතානගේ මහතා

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු සන්දිත් සමරසිංහ මහතා

ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු මුත්තු සිවලිංගම් මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

**ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රකාශනය අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. පාර්ලිමේන්තුව රැස්වීම පිණිස කරන ලද අතිගරු ජනාධිපතිතුමාගේ මතු පළ වන ප්‍රකාශනය පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් කියවන ලදී.**

මුද්‍රාව

"අතිගරු ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශනයයි

මෛත්‍රීපාල සිරිසේන

ජන ජීවිතයට අත්‍යාවශ්‍ය වන්නා වූ සේවාවක් වන පහත උපලේඛනයේ දක්වා ඇති සේවාවන් පවත්වාගෙන යාම මහජන යහපත සඳහා අවශ්‍ය බවට තීරණය කර ඇති හෙයින්, එකී උපලේඛනයේ දක්වා ඇති සේවාවන් අත්‍යාවශ්‍ය සේවාවන් බවට ප්‍රකාශ කරන්නා වූ නියෝගයක්, (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 17 වන වගන්තියේ ප්‍රකාරව ප්‍රකාශයට පත් කර ඇති හෙයින් ද, එකී මහජන ආරක්ෂක ආඥාපනතේ 21(2) වගන්තිය සමඟ කියවිය යුතු 2(3) වගන්තිය අනුව එකී ප්‍රකාශය පිළිබඳව පාර්ලිමේන්තුවට දන්වා යැවිය යුතු යැයි නියම කරනු ලැබ ඇති හෙයින් ද,

ඒ ප්‍රකාශය නිකුත් කරනු ලැබූ දිනයේ දී පාර්ලිමේන්තුව දින දහයක් තුළ දී අවසන් නොවන්නා වූ කාල සීමාවක් සඳහා කල් තබා ඇති හෙයින් ද,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 වන ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු මහජන ආරක්ෂක ආඥාපනතේ 2(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ජනාධිපති, මෛත්‍රීපාල සිරිසේන වන මම, අත්‍යාවශ්‍ය සේවා නියෝගයක් ප්‍රකාශයට පත් කරන ලද බව පාර්ලිමේන්තුවට දන්වා සිටීම සඳහා, 2017 අප්‍රේල් මස 28 වැනි දින පෙ.ව. 9.30ට පාර්ලිමේන්තුව රැස්වීම පිණිස මේ ප්‍රකාශය මඟින් කැඳවා සිටිමි.

වර්ෂ දෙදහස් දහහතක් වූ අප්‍රේල් මස 25 වැනි දින වූ මෙදින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

පී. බී. අබේකෝන්,

ජනාධිපති ලේකම්."

**උපලේඛනය**

වීදියෙන් ඉවතලන කැළි කසළ, නිවාසවලින් ඉවතලන කැළි කසළ හෝ එබඳු වෙනත් දෑ ඉවත් කරලීම, එක්රැස් කරලීම, ප්‍රවාහනය, තාවකාලිකව ගබඩා කිරීම, පිරිසැකසුම, වෙන් කිරීම, පිළියම් යෙදීම, බැහැර කිරීම සහ විකිණීම සඳහා යම් පළාත් පාලන ආයතනයක් විසින් හෝ එබඳු යම් පළාත් පාලන ආයතනයක් සඳහා හෝ වෙනුවෙන් ඉෂ්ඨ කරනු ලබන හෝ පවත්වාගෙන යනු ලබන හෝ කිසියම් කාර්යය පැවරුමක් සම්බන්ධයෙන් ඉටු කරනු ලැබිය යුතු හෝ ඉටු කිරීමට අවශ්‍ය වන්නා වූ කවර වුව ආකාරයේ සියලුම සේවාවන්, වැඩ හෝ ශ්‍රමය යෙදවීම

**2. ජනාධිපතිතුමාගෙන් ලත් සංදේශ :** අතිගරු ජනාධිපතිතුමාගෙන් ලැබුණු මතු පළවන සංදේශ කථානායකතුමා විසින් කියවන ලදී.

**"ශ්‍රී ලංකා ජනාධිපති**

**මගේ අංකය: සීඑස්ජ්/1/44**

**2017 අප්‍රේල් මස 25 වන දින**

**ගරු කරු ජයසූරිය මැතිතුමා**
**කථානායක**
**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

**ගරු කථානායකතුමනි,**

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතෙහි 17 වන වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, ජන ජීවිතයට අත්‍යවශ්‍ය වන සේවාවන් පවත්වාගෙන යාම මහජන යහපත උදෙසා අවශ්‍ය බැව් සැලකිල්ලට ගනිමින් අංක 2015/53 හා 2017.04.20 දිනැති ගැසට් නිවේදනයෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති සේවාවන් පූර්වෝක්ත වගන්තියෙහි කාර්ය සඳහා අත්‍යවශ්‍ය සේවාවන් බවට ආඥාවක් නිකුත් කර ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතෙහි 21(2) වගන්තිය සමඟ කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට-හිතවත්,

මෛත්‍රීපාල සිරිසේන."

**3. කථානායකතුමාගේ නිවේදන :** කථානායකතුමා විසින් මතු පළවන නිවේදන කරන ලදී,—

**I**

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, 2017 අප්‍රේල් 07 දින මා විසින් 'ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන)' නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දැන්වීමට කැමැත්තෙමි."

**II**

“ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, ‘විදේශ විනිමය’ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම් තුනක පිටපත් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.”

**4. කාරක සභා වාර්තා පිළිගැන්වීම :** රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද “ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත”, “විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන්”, “රේගු ආඥා පනත යටතේ යෝජනා”, “වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියෝගය” සහ “නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමයන් ” සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව, පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**5. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1) :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7හි විධිවිධානවල සහ 2016.03.08 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, අද දින පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ. භා. 12.30 දක්වා සහ අ. භා. 1.30 සිට අ. භා. 6.30 දක්වා ද විය යුතු ය. පූ. භා. 9.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7(5) ඡේදය ක්‍රියාත්මක විය යුතු ය. අ. භා 6.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල්තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2) :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින විසිර යැමේදී මෙම පාර්ලිමේන්තුව 2017 මැයි මස 03 වැනි බදාදා අ. භා. 1.00 වන තෙක් කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. කල් තැබීම (මීතොටමුල්ල කසළ කන්ද කඩා වැටීමෙන් සිදුවූ ඛේදවාචකය) :** “මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය”යි පාර්ලිමේන්තුවේ සභානායකතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

(පූ. භා. 11.42 ට නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.)

(අ. භා. 1.30 ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.)

“ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය යුතුය”යි තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 2.00 ට ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.)

“ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය යුතුය”යි මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 5.28 ට ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.)

එකල්හි වේලාව අ. භා. 6.30 වූයෙන් මූලාසනාරූඪ මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අද දින සභා සම්මතිය අනුව 2017 මැයි මස 03 වැනි බදාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.